# පරිත්‍රාණ ධර්ම දේශනයේ ඉතිහාසය හා විකාශනය

ත්‍රිපිටකවේදී උපාධි අපේක්ෂක

**වේවැල්දෙණියේ විනීත හිමි**

පෙරදිග විසූ අන්‍යාගමිකයන් මෙන්ම බෞද්ධයෝ ද ගුප්ත බලවේගයන් පිළිබඳව විශ්වාස කළහ. ඔවුන් පිරිත කෙරෙහි විශේෂ විශ්වාසයක් තැබූ බව කිවයුතුය. අද විශේෂයෙන් ලක්දිව බෞද්ධ ජනයා ආරක්ෂාව ආදි කරුණු බලාපොරොත්තුවෙන් පිරිත් දේශනා කරවා ගනිති. මේ පිළිබඳව සඳහන් කරන විට පිරිත පිළිබඳව යොද ඇති නිර්වචන විමසීම වැදගත්ය.

" පරි සමන්තතො තායතී රක්ඛතීති පරිත්තං "
" අන්තරායං පරිහරන්තො තායතීති පරිත්තං "
" පරිතො වා සබ්බූපද්දවතො තායතීති පරිත්තං "

ආදි වශයෙන් මෙ සඳහා නිර්වචන ඉදිරිපත් කොට ඇත. මේ අදහස දම්පියා අටුවා ගැටපදයේ " අනතුරු දුරුකොට රකීනුයි පරිත්ත නම්. හැම අතින්ම උවදුරුවලින් වලකා රැක ගනුයි පරිත්ත නම් " යන පාඨයෙන් එය හඳුන්වා ඇත. " සියලු දුක්වලින් සියලු භයවලින් සියලු රෝගවලින් මිදීම සඳහා මංගල සම්මත පිරිත් දේශනය කරනු මැනවි " යන්න පිරිත් දේශනය කරවා ගැනීම සඳහා ආරාධනා කරන " විපත්ති පටිබාහාය " යන ගාථාවලින් කියවෙන අරුතයි. මේ නිසා පිරිත කෙරෙහි බෞද්ධයන් දැඩි භක්තියක් ඇතිකර ගන්නා අතර පිරිතෙහි කිව නොහැකි බලයක් ඇති බව ද සඳහන් කළ යුතුය.

දැනට අප පිරිත් පොත වශයෙන් භාවිත කරන්නේ චතුභාණවාර පාළියයි. මෙහි එක බණවරකට අකුරු අටදහක් බැගින් අයත් වේ. එසේ අටදහ බැගින් ඇතුළත් වන කොටස් හතරට " චතුභාණවාර පාළි " යි නම් කෙරේ. මෙහි මුල් බණවර සරණාගමනයෙන් පටන් ගෙන ධජග්ග සූත්‍රයෙන් නිම වේ. දෙවන බණවර බොජ්ඣඞ්ග සූත්‍රවලින් පටන් ගෙන ඉසිගිලි සූත්‍රයෙන් නිමවේ. තෙවන බණවර ආටානාටිය සූත්‍රයේ පළමු බණවරින් ද සිව්වන බණවර ආටානාටිය දෙවන බණවරින් ද නිමාවට පත් වේ. චතුභාණවාර පාළි නම් පිරිත් පොතේ එන ධම්මචක්ක, මහාසමය, ආලවක, කසීභාරද්වාජ, සච්චවිභංග යන සූත්‍ර චතුභාණවාර සංඛ්‍යාවට අයත් නැත. එහෙත් අට්ඨකථාවේ ඒ සූත්‍රවල අටුවාද දක්නට ලැබේ. වැලිවිට සංඝරාජ මාහිමියන් ලියූ චතුභාණවාර සන්නයට මෙම සූත්‍ර හත ඇතුළත් වී නැත. ලෝක සත්වයාට ආරක්ෂාව සැලසෙන පරිදි බුදුරජාණන් වහන්සේගේ ආඥා බලය පතුරුවා දේශනා කර වදළ සූත්‍ර සහිතව වැදගත් යයි සලකනු ලැබූ සූත්‍ර ඇතුළත් කොට චතුභාණවාර පාළිය සකස්කොට ඇත. චතුභාණවාර පාළියට ඇතුළත් නොවූව ද ගිනි පිරිත, ජය පිරිත, ජිනපංජරය, ඇනවුම් පිරිත, ජයමංගල ගාථා ආදි පිරිත් රාශියක් වර්තමාන පිරිත් පොතට ඇතුළත් කර ඇත. එයින් කීපයක් දේශනා පාළියෙන් ගන්නා ලද්දේය. ඉතිරි කොටස් බුද්ධ කාලයට පසුව උගතුන් විසින් සකස් කරන ලද බව සැලකිය හැකිය. මහානුභාව සම්පන්න අංගුලිමාල පිරිත ද ''අභිත්ථනය පජ්ජුන්න'' ආදි වශයෙන් එන වැසි පිරිත ද බුද්ධ දේශනා හෙයින් චතුභාණවාර පාළියට ඇතුළත් නොකරන ලද්දේ මක්නිසාද යනු විමසිය යුත්තකි. මෙහි එන සරණාගමනය, දස ශික්ෂාපද, සාමණේර පැනය, ද්වත්තිංසාකාරය, මංගල සූත්‍රය, රතන සූත්‍රය, කරණීය මෙත්ත සූත්‍රය, ඛන්ධ පිරිත, චන්ද, සූරිය, ධජග්ග, බොජ්ඣඞ්ග වැනි පිරිත් සංයුක්ත නිකායෙන් ද ඉසිගිලි සූත්‍රය මජ්ඣිම නිකායෙන්ද ආටානාටිය සූත්‍රය දීඝනිකායෙන්ද ආදි වශයෙන් ඒ ඒ සූත්‍ර උපුටා ගත් පෙළපොත් පිළිබඳ තොරතුරු චතුභාණවාර අට්ඨකථාවේ දැක්වේ. මෙහි එන ආටානාටිය සූත්‍රය එකවරම නොකිය යුතු බව එහි එන " ආටානාටිය පරිත්තස්ස පරිකම්මං වෙදිතබ්බං, පඨමමෙවහි ආටානාටියං න භණිතබ්බං මෙත්ත සුත්තං ධජග්ග සුතතං රතන සුත්තන්ති ඉමානි සත්තාහං භණිතබ්බානි " යන පාඨයෙන් කියවේ.

මීලඟට අප බැලිය යුත්තේ මෙසේ පිළිවෙළකට සරණාගමනය, ශික්ෂාපද, සාමණේර පැනය, ද්වත්තිංසාකාරය, ප්‍රත්‍යවෙක්ෂා, දසධම්ම ආදී සූත්‍ර ඇතුළත් කර ඇත්තේ කුමන පදනමක් මතද කියායි. සසරින් එතෙරවීම සඳහා තෙරුවන් සරණ යෑම අත්‍යවශ්‍ය නිසා එය මුලට යෙදූ බවත් ඊට පසු සසරින් මිදිය යුතු උපාසකයකු හෝ පැවිද්දකු ශික්ෂා පදවල පළමුව හික්මිය යුතු බවත් ඒ නිසා ඒවා දෙවැනිව දක්වා ඇති බවත් දස ශික්ෂාපද රැකීමෙන් සාමණේර භූමියේ පිහිටි සත්තවසසික කුමාරයාද සබබ ඤ්ඤුත ඤාණයෙන් සසඳා දස පැනයට පිළිතුරු දුන් නිසාත් ශාසන සම්පත්තිය සඳහාත් සජ්ඣායනය අසන්නන් ගේ සසුනේ පැහැදීම සඳහාත් මෙම සාමණේර පැනය යෙදූ බවත් මේ ආදී වශයෙන් එක්තරා ක්‍රමයකට ඒවා යෙදූ බව චතුභාණවාර අට්ඨකථාව දක්වයි.

පිරිතේ ඉතිහාසය ප්‍රාග් බෞද්ධ යුගය දක්වා ඈතට විහිදී යයි. එහෙත් පිරිත ආරම්භ වූයේ කවදා දැයි නිශ්චිත වශයෙන් කිව නොහැකිය. ජාතකට්ඨකථාවට අනුව ප්‍රාග් බෞද්ධ යුගයේ දී පවා පිරිත පැවති බවට කරුණු ඇත. එම යුගයට අයත් ව පිරිත් පොතට ඇතුළත් කර ඇති සූත්‍ර දෙකක් වෙයි මොරපරිතත හා මිතතානිසංස යනු ඒ සූත්‍ර දෙකයි. මයුරයකු විසින් ආරක්ෂාව පතා භාවිතා කළ ගාථා දෙකක් මොරපරිත්ත නමින්ද, මිත්තානිසංස නමින් මිත්‍රද්‍රෝහි නොවීමේ ආනිසංස දක්වන පිරිතක්ද දක්නට ලැබේ. මේ අනුව බලන විට බුද්ධ කාලයට පෙර පවා ආරක්ෂාව පතා පිරිත් ගාථා භාවිතය පැවැති බවට කරුණු එයි. කරණීය මෙත්ත සූත්‍රය ද එවැනි වැදගත් පිරිතකි. භාවනානුයෝගී භික්ෂූන්ගේ ආරක්ෂාව හා කර්මස්ථානයක් වශයෙන් දේශිත මෙම සූත්‍රය අද පොදු ජනයාගේ ගෞරවාදරයට පාත්‍රවන ආරක්ෂාකාරී පිරිතකි.

බුද්ධ කාලයේ සිදුවූ යම් යම් රෝග උපද්‍රව සඳහා බුදුරජාණන් වහන්සේගේ උපදෙස් පරිදි පිරිත් දේශනා කරවා පිරිත් පැන් දෙවූ බවට කරුණු බෞද්ධ සාහිත්‍යයේ එයි. ඒ අතර විශාලා මහනුවර ඇති වූ තුන් බිය දුරු කිරීම සඳහා අනඳ හිමි ලවා පිරිත් පැන් ඉස්සවීම ප්‍රධාන තැනක් ගනී. මෙය පිරිත බෞද්ධ ඉතිහාසයේ පළමුවරට විපත්ති නිවාරණ දහමක් ලෙස භාවිතා කළ අවස්ථාවකි. අංගුලිමාල පිරිතද එවැනි බල සම්පන්න පිරිතකි. ප්‍රසව වේදනාවෙන් පෙළෙන ගැබිනි මවකට බුදුරජාණන් වහන්සේගේ උපදෙස් පරිදි අඟුල්මල් හිමියන් විසින් අංගුලිමාල පිරිත දේශනා කොට එකී මව සුවපත් කරවන ලදී. තවත් වරෙක සීවලී මහරහතන් වහන්සේගේ මව වන සුප්පියා නම් දේවිය ප්‍රසව වේදනාවෙන් දුක් විඳින බව බුදුරජාණන් වහන්සේට දැන්වූ කල උන්වහන්සේ,

"සුඛිනී හොතු සුප්පියා කොලියධීතා . . . . .
අරොගා අරොගං පුත්තං විජායතු"

යන පාඨයෙන් ආශිර්වාද කළ සේක. පණිවිඩය රැගෙන ආ පුද්ගලයා ගෙදර ගිය විගස එම දේවිය නිරුපද්‍රැතව සිය දරුවා බිහි කළ බව සීවලී හිමියන්ගේ උත්පත්ති කථාවේ එයි. වර්තමානයේදී පවා අංගුලිමාල පිරිත කියවාගෙන ප්‍රතිඵල ලබන බෞදධ ජනයා බොහෝය. පිරිතේ ඇති ශබ්ද මාධුර්‍යය නිසා පොදු ජනයා තුළ පිරිත පිළිබඳව ප්‍රිය ජනක බවක් ඇති බව ඉඳුරා කිව හැකිය.

**මන්ත්‍ර භාවිතය හා පිරිත**

පිරිතේ ඉතිහාසය ගැන කථා කරන විට මන්ත්‍ර භාවිතය පිළිබඳව ද යමක් කිව යුතුය. එයින් මිනිසාගේ යහපත අයහපත දෙක සඳහා භාවිතා කළ මන්ත්‍ර අථර්වන් වේදයේ ඇතුළත් ය. ආදී කාලීන මිනිසා වේද මන්ත්‍රවල පිහිට පැතුයේ තමන්ට ඇතිවන රෝග අමනුෂ්‍ය භය ආදී උපද්‍රව දුරුකර ගැනීම සඳහාය. බුදු දහමින් යන්ත්‍ර මන්ත්‍රවලට එතරම් ප්‍රමුඛස්ථානයක් නැති අතර පිරිත ඔවුන්ගේ ආරක්ෂාව ලබාදෙන ඒකීය ශාන්ති කර්මය විය. වැසි වැස්සවීම සඳහා භාවිත කළ මන්ත්‍ර වේද සාහිත්‍යයේ ඇති අතර බෞද්ධයන් අතර ද අතීතයේ සිට ම වැසි පිරිත නමින් සම්භාවිත පිරිතක් ඇත.

සුභූතො ච මහාථෙරො — මහාකායො මහොදරො
නීලවණ්ණො මහා තෙජො — පවසසන්තු වලාහකා

ආදී වශයෙන් ඒ වැසි පිරිත එයි. ආයුෂය වර්ධනය කර ගැනීම සඳහා අථර්වන් වේදයේ ආයුෂ්‍ය සූක්ත නමින් මන්ත්‍ර විශේෂයක් ඇත. එසේම දීර්ඝායු ලැබීම සඳහා පිරිත් දේශනා කරවා ගැනීම

තවත් අරමුණකි. බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහාසංඝරත්නය විසින් සතියකින් මිය යාමට සිටි කුමරාට පිරිත් කියවීමෙන් අවුරුදු 120ක් ජීවත් වූ දීඝායු කුමරාගේ කථා පුවත මෙහිදී සිහියට නැගේ.

## පිරිත පිළිබඳව බෞද්ධ සාහිත්‍යයෙන්

විජය කුමරු ලක්දිවට ගොඩ බසින විට සක්දෙවිඳුගේ නියමය පරිදි උපුල්වන් දෙවිඳු කුමරුට පිරිත් පැන් ඉස පිරිත් නූලක් අතේ බැන්ද බව මහාවංශයේ එයි. මෙයින් අපට පෙනී යන්නේ ලක්දිව මුල් යුගයේ පවා පිරිත පිළිබඳව මූලික සිද්ධාන්ත පැවති බවයි. මහියංගන බෝමළුවේ දී පිරිත් දේශනා කරන අතර චූලාභය රජු තම පුත් සහබෝ කුමරු නන්ද තෙරුන්ට බාරදුන් බව අත්තනගලු වංශයේ දැක්වේ. මහාසමය හා මහාධම්මසමාදාන යන සූත්‍ර ඉතා මධුර ලෙස දේශනා කළ නිසා ඊට පැහැදුන දේවතාවන් දෙදෙනකු ඒ භික්ෂූන්ට ප්‍රශංසා කළ බව දීඝනිකායට්ඨකථාව දක්වයි. දීඝවාපි චෛත්‍යය පිරිසිදු කරමින් සිටි භික්ෂුවක් හදිසියේ පය ලිස්සා බිම වැටෙන විට ධජග්ග සූත්‍රය මෙනෙහි කරවීම නිසා කිසිම උවදුරක් නොවී බේරුන පුවතක් සංයුක්ත නිකායට්ඨකථාවේ දැක්වේයි. දිට්ඨ ධම්ම වේදනීය වශයෙන් පිරිතේ ගුණ ලැබූ ප්‍රභූ පුද්ගලයන් අතර බුදුරජාණන් වහන්සේට ප්‍රධාන තැන හිමිවේ. උන්වහන්සේ තමන්ට යම්කිසි ආබාධයක් ඇතිවූ විට චුන්ද හිමියන් ලවා චුන්ද බොජ්ඣඞ්ගය දේශනා කරවා ගෙන ඉන් සුවය ලැබූ බව ප්‍රසිද්ධ කරුණකි. එසේම බුදුන් වහන්සේගේ උපදෙස් පරිදි අනඳ හිමියන් ගිරිමානන්ද හිමියන්ට දේශිත ගිරිමානන්ද සූත්‍රය ද වැදගත්ය. මෙම පිරිත් අද පවා බෞද්ධ ජනයා අතර සම්භාවිත වේ. පිරිතෙන් ගුණ ලැබූ රජවරුද බොහෝය. 1 වන උපතිස්ස රජු රටේ සිදුවූ සාගතය හා දුර්භික්ෂය දුරලනු වස් අනඳ හිමි පිළිරුව වැඩමවා භික්ෂූන් ලවා පිරිත් කියවා පිරිත් පැන් ඉස සෙත් පැතූ බව පැරකුම්බා සිරිතේ එයි. එසේම අනුරාධපුර යුගයේදී රටේ ඇතිවූ රෝග අමනුෂ්‍ය දුර්භික්ෂ ආදි උවදුරු දුරුකර ගැනීම සඳහා විශේෂ පිරිත් පිංකම් පැවැත්වූ බව ඉතිහාසය කියයි. කීර්ති ශ්‍රී රාජසිංහ රජු ද රාජ්‍යයට පත්වූ විගස භික්ෂූන් ලවා පිරිත් දේශනා කරවා ගෙන ආශිර්වාද ලබාගත් බව මන්දරම් පුර පුවතින් පෙනේ.

පිරිත් ධර්මයේ ව්‍යාප්තිය ගැන කථාකරන විට පිරිත් මණ්ඩපය ගැන ද යමක් කිව යුතුය රතන සූත්‍රය දේශනා කළේ අලංකාරයෙන් සරසා සුවඳවත් කළ සන්ථාගාර ශාලාවේය. එසේම දීඝායු කුමරුට සෙත් පැතීම සඳහා කළ පිරිත සඳහාද ගෙය ඉදිරි පස මණ්ඩපයක් තනන ලෙස බුදුරජාණන් වහන්සේ උපදෙස් දී ඇත. මෙසේ එදා සිට අද දක්වා තම තමන්ට හැකි ඉහළම අයුරින් අලංකාරවත්ව හා කලාත්මකව මෙම මණ්ඩපය සෑදීමට ජනයා උත්සුක වේ. පිරිත් මණ්ඩපයේ ඉන්ද්‍රඛීලයක් ද වර්තමානයේ දක්නට ඇත. මෙය සාමාන්‍ය පිරිත් දේශනාවලදී නොව සත් වරුවේ සත් දවසේ පිරිත් වැනි විශේෂ අවස්ථාවලදී සාදනු ලබයි. තිස් පැ පිරිතේදී සෑදීම ද වරදක් නොවේ. පිරිත් හුය බැඳීම ආදි ප්‍රයෝජන තකා සාදා ගන්නා ලද ප්‍රධාන කනුව ඉන්ද්‍රඛීලයයි. එසේම මණ්ඩපය නාදළු, බුලත්, පුවක් මල් වැනි රෝග දුරු කරන ඖෂධීය ගුණයෙන් යුත් ද්‍රව්‍යයන්ගෙන් අලංකාර කෙරේ. ලදපස්මල් ඉසීම, පුන් කලස් තැබීම ද අද පිරිතටම යාවී ඇත. මෙම බාහිර අලංකාර මහායාන බලපෑම මත ඇතුළත්වී යයි සිතේ. පිරිත් නූල් බැඳීමක් පිළිබඳව මුල් යුගවලදී තොරතුරු දක්වා නැත. පසුව එය ආරම්භ වීය. ඉතා ජනප්‍රිය අංගයක් ලෙස පිරිත් නූල් බැඳීම දැක්විය හැකිය.

දේශකයන් වහන්සේ කරුණා සිතින් යුක්තව පිරිත දේශනා කළ යුතුය. පිරිත් දේශනා ක්‍රම විවිධය. ඒ ඒ පලාත්වල ඒ ඒ නිකායික භික්ෂූන් පිළිගත් ක්‍රම අදත් එසේම පවතී. මහ පිරිතට සියලු දෙනාමත් අනික්වාට දෙනම හෝ සිවනම බැගිනුත් යෙදී දේශනා කිරීම අද සිරිතයි. පළමුව පිරිස පන්සිල්හි පිහිටුවා පිරිත් ජේ කිරීම සිරිතයි. මෙවායේ ද අද යම් යම් වෙනස් කම් පලාත් අනුව දක්නට ඇත. ජේ කිරීම යනු නියම පිරිත ආරම්භ කිරීමට පළමුව ත්‍රිවිධ රත්නයේ බල පිහිටුවා ආරක්ෂාව ලබා ගැනීමයි. පිරිත් සූත්‍ර අතර පරිකර්මවිධි රාශියක් ආටානාටිය සූත්‍රයට ඇතුළත්ය. මෙසේ සූත්‍ර කීපයකින් ඇරඹුණු පිරිත බණවර පහක් පමණ වනතුරු විශාලව ගොස් බාහිර අලංකාර යෙන් හා මිශ්‍රව උත්සවාකාරයෙන් පිරිත් දේශනා කිරීම දක්වා අද එය වර්ධනය වී ඇත. පිරිත ශ්‍රවණය කරන්නවුන්ගේ ශ්‍රද්ධාදී ගුණ ධර්මයන් නිසාම ප්‍රතිඵල ලැබේ යැයි කිව නොහැකිය. මෙහි වගකීම විශේෂයෙන් දේශකයා සතුය. මන්ත්‍රයට සිද්ධිය ලබන්නාක්මෙන් පිරිතටද සිද්ධිය ලැබිය යුතුය.



5—A081356

පිරිත් දේශනය කරන්නා ආතුරයා කෙරෙහි නියම කරුණාවකින් යුතුව එය කළ යුතුය. එසේ නැතිව තාලයට ඇද මිහිරිව කී පමණින් නියම ප්‍රතිඵල නොලැබේ. දේශකයා තමන් දේශනා කරන සූත්‍රයන්හි අර්ථ දැනගත යුතුය. දැන ඒවා මෙනෙහි කරමින් කරුණාවෙන් මෛත්‍රියෙන් යුක්තව දේශනා කළ යුතුය. මෙම සත්‍යයේ බලයෙන් ඔබට සෙත් වේවායයි අවංක සිතින් මෙත් වැඩිය යුතුයි.

මෙසේ බුදුන් වහන්සේ යම්කිසි විපත්තිදායක කරුණක් මුල්කොට ගෙන භික්ෂූන්ට පිරිත් දේශනා අනුදැන වදළහ. අද පිරිත් දේශනා සති පිරිත දක්වා දීර්ඝ වී තිබේ. පලාත් අනුව නිකායන් අනුව නොයෙක් ආකාරයට පිරිත විකාශනයවී ඇති බවද කිව යුතුය. එසේම තවත් සමහරු සති පිරිත් පිංකම් පවත්වා අවසාන දිනයේ දෙරකඩ අස්න අනුශාසනා ආදිය ඇතුළත් කොට පිරිත නවතාවය කට නව විකාශනයකට පත් කිරීමට සමත් වූහ. මහනුවර යුගයේදී පමණ මෙම දෙරකඩ අස්න හා අනුශාසනා ඇතුළත්වී යැයි සැලකේ. කෙසේ හෝ අද පිරිත මේ අයුරින් විකාශනයවී මහජනතාවට නැතුවම බැරි අත්‍යවශ්‍ය අඞ්ගයක් බවට පරිවර්තනය වී ඇති බව කිව හැකිය.